ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකः 2477424, 2477423, 2477311
ෆැක්ස්ः 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවියः www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **මූල්‍ය බුද්ධි ඒකකය** |
| දිනය | **2016 සැප්තැම්බර් 22** |

## ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය, සිංගප්පූරුවේ සැක කටයුතු ගනුදෙනු වාර්තා කිරීමේ කාර්යාලය සමඟ අන්‍යොන්‍ය අවබෝධතා ගිවිසුමකට එළඹෙයි

2006 අංක 6 දරණ මුදල් ගනුදෙනු වාර්ථා කිරීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය (FIU – Sri Lanka) සිංගප්පූරුවේ සැකකටයුතු ගනුදෙනු වාර්ථා කිරීමේ කාර්යාලය (STRO) සමග 2016 සැප්තැම්බර් 01 වන දින අවබෝධතා ගිවිසුමකට එළැඹිණ. අන්‍යොන්‍ය අවබෝධතාවය සහ එකිනෙකා පිළිබඳව දක්වන සහයෝගීතාවය සහ සැලකිල්ල පදනම් කරගෙන, එක් එක් ආයතනයට අදාළ ජාතික ව්‍යවස්ථාපිත රාමුව තුළ හිඳිමින් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදීන්ට අරමුදල් සැපයීමට අදාලව පරීක්ෂණ සහ නඩු පැවරීම්වලට තොරතුරු හුවමාරු කර ගැනීමට අවස්ථාවක් සළසාදීම මෙම අවබෝධතා ගිවිසුම්වලට එළැඹීමේ මූලික පරමාර්ථය වේ.

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමයනු ජාත්‍යන්තර වශයෙන් එකිනෙකට සම්බන්ධ වන මූල්‍ය අපරාධයන් වන අතර එමගින් ගෝලීය ආර්ථිකයේ සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවයට තර්ජනයක් එල්ලවීමේ හැකියාව ඇත. එබැවින්, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට විරුද්ධව කටයුතු කිරීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකයන් අතර ගෝලීය සම්බන්ධීකරණයක් පැවතීම අත්‍යවශ්‍ය වේ. මේ අනුව, පරීක්ෂණ කටයුතුවලට අවශ්‍ය තොරතුරු හුවමාරුකර ගැනීම සඳහා සිංගප්පූරුවේ සැක කටයුතු ගනුදෙනු වාර්ථා කිරීමේ කාර්යාලය සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමද ඇතුළත්ව විදේශීය මූල්‍ය බුද්ධි ඒකකයන් 32ක් සමඟ ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය මේ වන විට අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඇත.